සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම 2021
ஆண்டிறுதிப் பரீட்சை
Year End Evaluation

| ශ්‍රේණිය / தரம் / Grade | 8 | විෂයය / பாடம் / Subject | බුද්ධ ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper | I | පැය / மணித்தியாலம் / Hours | 2 |
|---|---|---|---|---|---|---|---|

- **සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**
- **නිවැරදි පිළිතුර තෝරන්න. යටින් ඉරක් අඳින්න.**

(1) දේවදත්ත කුමරු පැවිදි වූයේ,
   i. ආනන්ද, භගු, කිම්බිල, උපාලි ආදීන් සමග ය.
   ii. අනුරුද්ධ, නන්ද, ආනන්ද, කිම්බිල ආදීන් සමග ය.
   iii. ආනන්ද, භද්දිය, රාහුල, කිම්බිල ආදීන් සමග ය.
   iv. අනුරුද්ධ, සුනීත, භද්දිය, කිම්බිල ආදීන් සමග ය.

(2) කාන්තාවන් භික්ෂුණියක් වශයෙන් පැවිදි වූ පසු උපසම්පදාව ලැබීමට ශික්ෂාමාතාවක්ව කටයුතු කළ යුත්තේ,
   i. අවු: 1 කි.
   ii. අවු: 2 කි.
   iii. අවු: 3 කි.
   iv. අවු: 4 කි.

(3) බුදුන්වහන්සේගේ සුහදශීලී කතාබහ තුළ දැකිය හැකි "පුබ්බභාසී " ගුණාංගයෙන් අදහස් වන්නේ,
   i. කනට සුව එළවන කතාබහය.
   ii. සතුටු සාමීචි කතාබහය.
   iii. පළමුවෙන්ම කතා කිරීමය.
   iv. විවෘත කතාබහය.

(4) බුදුන්වහන්සේ සියළු කෙලෙසුන් දුරුකොට සියළු පාපයන්ගෙන් මිදුණ නිසා,
   i. 'භගවා' නම් වන සේක.
   ii. 'සුගත' නම් වන සේක.
   iii. 'අරහං' නම් වන සේක.
   iv. 'ලෝකවිදූ' නම් වන සේක

(5) බුදු සසුනේ ප්‍රඥාවන්ත භික්ෂූන් අතර අගතනතුර ලැබුවේ,
   i. මුගලන් හිමියන් ය.
   ii. අනුරුද්ධ හිමියන් ය.
   iii. මහා කාශ්‍යප හිමියන් ය.
   iv. සැරියුත් හිමියන් ය

(6) පන්සිල්වල ඇතුළත්ව ඇතත් අටසිල්වල ඇතුළත් නොවන ශික්ෂා පදයක් වන්නේ,
   i. පාණාතිපාතා වේරමණී සික්ඛා පදං සමාදියාමි
   ii. අදින්නාදානා වේරමණී සික්ඛා පදං සමාදියාමි
   iii. කාමේසුමිච්ඡාචාරා වේරමණී සික්ඛා පදං සමාදියාමි
   iv. මුසාවාදා වේරමණී සික්ඛා පදං සමාදියාමි

(7) මුළු සම්බුදු සසුනම රඳාපවතින්නේ කල්‍යාණමිත්‍ර ආශ්‍රයම නිසා බව බුදුන්වහන්සේ දේශනා කළේ,
   i. ආනන්ද හිමියන්ට ය.
   ii. සැරියුත් හිමියන්ට ය.
   iii. මුගලන් හිමියන්ට ය.
   iv. දේවදත්ත හිමියන්ට ය.

(8) පංචස්කන්ධයට අයත් "සඤ්ඤා" යන්නෙහි අදහස් වන්නේ,
   i. සුඛ, දුක්ඛ, උපේක්ඛා ය.
   ii. අරමුණ හඳුනා ගැනීමය.
   iii. මානසිකව කරන රැස්කිරීමය.
   iv. පංච ඉන්ද්‍රියන් මගින් අරමුණු ගැනීමය

(9) "අභිජ්ඣා" යනු,
   i. නොදැනීමයි.
   ii. දැඩි තරහවයි.
   iii. විභව ලෝකයයි.
   iv. දැඩි ඊර්ශ්‍යාවයි.

(10) උම්මග්ග ජාතක කතාවෙන් පෙන්නුම් කරන්නනේ මහ බෝසතුන්,
   i. ප්‍රඥා පාරමිතාව පිරූ අයුරුයි.
   ii. සීල පාරමිතාව පිරූ අයුරුයි.
   iii. වීර්ය පාරමිතාව පිරූ අයුරුයි.
   iv. සත්‍ය පාරමිතාව පිරූ අයුරුයි.

(11) සත්ත්වයාගේ මරණ සතරාකාර වේ. ඉන් ‘උභයාර්ථ' මරණය යනු,

i. ආයුෂ ගෙවී යාමෙන් සිදුවන මරණය
ii. කර්ම ශක්තිය අවසන් වීමෙන් සිදුවන මරණය
iii. ආයුෂත් කර්ම ශක්තියත් දෙකම අවසන් වීමෙන් සිදුවන මරණය
iv. හදිසි මරණය

(12) පළමු ධර්ම සංගායනාවෙන් පසු මජ්ඣිම නිකාය කට පාඩමින් රැක ගැනීමේ වගකීම ලැබුවේ

i. ආනන්ද හිමියන් ප්‍රධාන භික්ෂු ශිෂ්‍ය පරපුරටය.
ii. සැරියුත් තෙරණුවන්ගේ භික්ෂු ශිෂ්‍ය පරපුරටය.
iii. මහා කාශ්‍යප තෙරුන් ප්‍රධාන භික්ෂු ශිෂ්‍ය පරපුරටය.
iv. සියලු තෙරුන් වහන්සේලාටය.

(13) බුදුන් වහන්සේගේ වම් දළදා වහන්සේ මෙරටට වැඩමවා ඇත්තේ,

i. කාලිංග දේශයේ සිටය
ii. ගන්ධාර දේශයේ සිටය
iii. නාග ලෝකයේ සිටය
iv. දිව්‍ය ලෝකයේ සිටය

(14) හේමමාලා හා දන්ත කුමරු ලක් දිවට දළදා වහන්සේ වැඩම වන විට ලක් දිව රජ කළ පාලකයා වූයේ,

i. කීර්ති ශ්‍රී රාජසිංහ රජුය
ii. විමළධර්මසූරිය රජුය
iii. කිත්සිරි මෙවන් රජුය
iv. විජය බාහු රජුය

(15) ගිහියා විසින් විඳිය යුතු සැප 4 ක් පිළිබඳ අනේපිඬුසිටු තුමාට බුදුන් වහන්සේ දේශනා කළ සේක. එම සැප ඇතුළත් සූත්‍රය වන්නේ,

i. සිගාලෝවාද සූත්‍රයයි.
ii. මංගල සූත්‍රය සූත්‍රයයි.
iii. අනණ සූත්‍රයයි.
iv. පරාභව සූත්‍රයයි.

(16) බුදුන් වහන්සේ සප්ත අපරිහානීය රාජ්‍ය ධර්ම දේශනා කළේ,

i. කොසොල් රජුටය
ii. බිම්බිසාර රජුටය
iii. සුදොවුන් රජුටය
iv. ලිච්ඡවී රජ දරුවන්ටය

(17) මංගල සූත්‍රයේ ඇතුළත් මංගල කරුණු ගණන වන්නේ,

i. 34 කි.
ii. 35 කි.
iii. 37 කි.
iv. 38 කි.

(18) නිවැරදි ප්‍රකාශය ඇතුළත් අංකය (වරණය) තෝරන්න.

i. බුදු හිමියන් දම්සක් සූත්‍ර දේශනාව සිදු කළේ ඉච්ඡානංගල නම් බමුණු ගමේදීය.
ii. බුදු හිමියන් තේවිජ්ජ සූත්‍රය දේශනා කළේ බරණැස ඉසිපතනාරාමයේය.
iii. බුදු හිමියන් මහාසීහනාද සූත්‍රය දේශනා කළේ සැරියුත් මහ තෙරුන් වහන්සේටය.
iv. බුදු හිමියන් කළන්දකනිවාප නම් වූ ගම්මානයේදී අම්බට්ඨ සූත්‍රය දේශනා කරන ලදී.

(19) "චේතනා හං භික්ඛවේ කම්මං වදාමි" ලෙසින් කර්මය පිළිබඳ දේශනා කළ සූත්‍රය වන්නේ,

i. චූල්ල කම්ම විභංග සූත්‍රයයි.
ii. නිබ්බේධික සූත්‍රයයි.
iii. කෝසල සංයුක්තයයි.
iv. දම්සක් පැවතුම් සූත්‍රයයි.

(20) භව තණ්හාව යනු,

i. ඉඳුරන් පිනවීමේ ආශාවයි.
ii. නැවත නැවත ඉපදෙමින් පස්කම් සැප විඳීමට ඇති ආශාවයි.
iii. නැවත උපතක් නැතැයි සිතා මෙලොවදීම පස්කම් සැප විඳීමට ඇති ආශාවයි.
iv. ශරීරයට අධික සැප දෙමින් නිවන් අවබෝධ කර ගැනීමට අවැසි ආසාවයි.

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

තෙවන වාර ඇගයීම - 2021
Year End Evaluation

| ශ්‍රේණිය / தரம் / Grade | 8 | විෂයය / பாடம் / Subject | බුද්ධ ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper | II | පැය / மணித்தியாலம் / Hours | 2 |
|---|---|---|---|---|---|---|---|

- **පළමුවන ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.**

(01)

i. දේවදත්ත තෙරුන් විසින් බුදුන් වහන්සේගෙන් ඉල්ලා සිටි පංචවරයෙන් 2 ක් ලියන්න.
ii. නන්ද කුමරු පැවිදි වන දවසේදී ඔහුගේ ජීවිතයේදී යෙදී තිබුන වැදගත් අවස්ථා තුනෙන් 2 ක් ලියන්න.
iii. ධර්ම රත්නයේ ගුණ හයක් ධර්මරත්නයට වදින ගාථාවේ දැක්වේ ඉන් 2 ක් සඳහන් කරන්න.
iv. ළමා කාලයට වැදගත් වන මංගල කරුණු 10 ක් මංගල සූත්‍රයේ මුල් කරුණු අතර සඳහන් වේ. ඉන් දෙකක් සඳහන් කරන්න.
v. සප්ත අපරිහානී ධර්ම අතරින් 2 ක් ලියන්න.
vi. අදහැමි වෙළඳාම් 5 ක් බුදු දහමෙහි දැක්වේ ඉන් 2 ක් නම් කරන්න.
vii. දළදා වහන්සේ වැඩ සිටි ස්ථාන 2 ක් ලියන්න.
viii. කරන කළට පව් මීරිය මී සේ
විඳින කළට දුක් වැඩිවෙයි ගිනි සේ
.........................................................
......................................................... යන කවිය සම්පූර්ණ කරන්න.
ix. දුක්ඛ සත්‍යයේ ආකාර 03ක් වේ. එයින් 02 ක් නම් කරන්න.
x. ශ්‍රී ලාංකේය පැරණි රජවරු ආගමික සහජීවනයෙන් කටයුතු කළ අවස්ථා බොහෝය. නිදසුන් ලෙස ඉන් 2 ක් නම් කරන්න.

(ලකුණු 20)

(02)

i. බුදු සිරිතෙන් මතුවන ආචාරශීලී ගති පැවතුම් 2 ක් නම් කරන්න. (ලකුණු 2)
ii. බුදුන්වහන්සේට මුහුණ දීමට සිදු වූ අභියෝග 3 ක් නම් කරන්න. (ලකුණු 3)
iii. චුල්ලපන්ථක හිමියන් මුල් කරගෙන ඇති වූ ගැටලුවට බුදු හිමියන් ක්‍රියා කළ ආකාරයෙන් බුදුන් වහන්සේ අපට ලබා දුන් ආදර්ශ 5 ක් ලියන්න. (ලකුණු 5)

(03)

i. උපතිස්ස කෝලිත යන දෙදෙනාගේ පැවිදි නම් වෙනවෙනම සඳහන් කරන්න. (ලකුණු 2)
ii. "යේ ධම්මා හේතුප්පභවා - තේසං හේතුං තථාගතෝ ආහ.' මෙම ගාථාව දේශනා කළේ කවුරුන් ද ?............................... කාහට ද? ...............................
දීඝනඛ පිරිවැජියාට බුදුන් වහන්සේ දේශනා කළ සූත්‍රයේ නම ලියන්න. (ලකුණු 3)
iii. මුගලන් මහරහතන් වහන්සේගෙන් සිදු වූ ශාසනික සේවා 5 ක් සඳහන් කරන්න. (ලකුණු 5)

(04)

i. යෝවපුබ්බේ පමජ්ජිත්වා
පච්චාසෝ නප්ප මජ්ජති
......................................
...................................... ගාථාවේ ඉතිරි පද දෙක ලියන්න. ( ලකුණු 2)

ii. යම් ක්‍රියාවක් අකුසල කර්මයක් දැයි තීරණය කිරීමේදී එම ක්‍රියාවෙන් ලැබෙන ප්‍රතිඵල ද සලකා බැලිය යුතුය.එම අවස්ථා 3 න ලියන්න. (ලකුණු 3)

iii. දස අකුසල කර්ම 10 ලියා ඒවා සිතින්, කයින් ,වචනයෙන් සිදුවන අයුරු බෙදා දක්වන්න. (ලකුණු 5)

(05)

i. පළමු ධර්ම සංගායනාව පැවැත්වූයේ කාගේ මූලිකත්වයෙන් ද අනුග්‍රහය දැක්වූයේ කවුද?

ii. මෙම සංගායනාවෙන් ශාසනික දියුණුවට ගත් ක්‍රියා මාර්ග 3 ක් ලියන්න. (ලකුණු 3)

iii. සංගායනාවේදී අනුගමනය කළ ක්‍රියා පිළිවෙත වර්තමානයේ සිදුවන බොහෝ ගැටලු විසඳා ගැනීමට ද ඉවහල් වන ආකාරය කෙටියෙන් ලියන්න. (ලකුණු 5)

(06)

i. දළදා වහන්සේ පිළිබඳ ලියා ඇති ග්‍රන්ථ 2 ක් නම් කරන්න. (ලකුණු 2)

ii. සියලුම දළදා පූජා පැවැත්වෙන කාලය අනුව ප්‍රධාන කොටස් 3 කට වර්ග කළ හැකිය. එය පිළිවෙලින් ලියන්න. (ලකුණු 3)

iii. ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 5)

(07)

i. සිඟාලෝවාද සූත්‍රයෙහි දැක්වෙන පරිදි භාර්යයාව විසින් ස්වාමියාට ඉටු කළ යුතු යුතුකම් අතරින් 4 ක් ලියන්න. (ලකුණු 2)

ii. හොඳ මිතුරෙකු වීම සඳහා ඔබ විසින් ගොඩනාගා ගත යුතු ගුණධර්ම 5 ක් ලියන්න. (ලකුණු 3)

iii. සේඛියා ධර්ම ක්‍රියාවට නැංවීම අපගේ ශිෂ්ට සම්පන්න බවට ඉවහල් වන අයුරු පැහැදිලි කරන්න. (ලකුණු 5)

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

තෙවන වාර ඇගයීම - 2021
Year End Evaluation

| ශ්‍රේණිය / தரம் / Grade | 8 | විෂයය / பாடம் / Subject | බුද්ධ ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper | I | පැය / மணித்தியாலம் / Hours | 2 |
|---|---|---|---|---|---|---|---|

# II පත්‍රය

| | |
|---|---|
| (1) - i | (11) iii |
| (2) - ii | (12) - ii |
| (3) - iii | (13) - i |
| (4) - ii. | (14) - iii |
| (5) - iv | (15) - iii. |
| (6) - iii | (16) - iv. |
| (7) - i | (17) - iv. |
| (8) - ii | (18) - iii. |
| (9) - iii | (19) - ii. |
| (10) - i | (20) - ii |

# II පත්‍රය

1.

i.

(1) භික්ෂූන් වහන්සේලා ජීවිතාන්තය දක්වාම අරණ්‍ය ගත විය යුතුයි.

(2) -------------------------------------------- පාංශකූලික විය යුතුයි.

(3) -------------------------------------------- වෘක්ෂ මූලික විය යුතුය.

(4) -------------------------------------------- මස් මාංශ වලින් වැලකිය යුතුයි.

ii. සරණ මංගල්‍ය, රාජාභිෂේකය, ගෙවදීම

iii. ස්වාක්ඛාතෝ සන්දිට්ඨිකෝ, අකාලිකෝ, ඒහිපස්සිකෝ,ඕපනයිකෝ, පච්චත්තං වේදිතබ්බෝ

iv. බාලයන් ඇසුරු නොකිරීම, පණ්ඩිතයන් ඇසුරු කිරීම, පිදිය යුත්තන් පිදීම, සුදුසු ප්‍රදේශයක වාසය කිරීම, පෙර කරන ලද පින් ඇති බව, හිත මනාකොට පිහිටුවා ගැනීම, දැන උගත් කම,ශිල්ප දැනීම, මැනවින් හික්මීම, යහපත් වචන කථා කිරීම (මින් දෙකක් ලියා තිබිය යුතුය.)

v. 21 පාඩම බලන්න.

vi. අවි ආයුධ වෙළඳාම, සත්ත්ව වෙළඳාම, මත් ද්‍රව්‍ය වෙළඳාම , වසවිස වෙළඳාම.

vii. පොළොන්නරුව, දඹදෙනිය, යාපහුව,කුරුණෑගල, බෙලිගල, දෙල්ගමුව, කෝට්ටේ

viii. හැඳින එපවි දුරලන උපදේසේ
නොදුන මැනවි තුන්දොර අවකාසේ

ix. දුක්ඛ දුක්ඛ, විපරිණාම දුක්ඛ, සංඛාර දුක්ඛ.

x. දුටුගැමුණු රජු එළාර රජුට නිසි ගෞරව දැක්වීම.
   වැව් පොකුණු අමුණු ආදිය පොදු පරිහරණයට ඉදි කිරීම.
   වැවයි දාගැබයි ගමයි පන්සලයි සංකල්පය මුල්කරගෙන ඒවා ඉදිකිරීම.
   දකුණු ඉන්දියාවෙන් මෙරටට පැමිණි රජ බිසෝවරුන්ට ආගමික වතාවත් සඳහා විහාරස්ථානයේම දේවාල ඉදිකිරීම.
   පටිමාඝර ඉදිකිරීමේදී දකුණු ඉන්දියානු ගෘහ නිර්මාණ සම්ප්‍රදාය ආභාෂයට ගැනීම
   දළදා උත්සවය, ශ්‍රී පාද වන්දනය ආදිය සලකා බලා ලකුණු දෙන්න.

2.

i. පෙළ පොතේ 1 පාඩම ඇසුරෙන් පිළිතුරු බලන්න.

ii. පෙළ පොතේ 1 පාඩම ඇසුරෙන් පිළිතුරු බලන්න.

iii. ඉක්මන් තීරණ නොගැනීම. මහා පන්ථක හිමියන්ගේ අදහස පිළිනොගැනීම. චුල්ලපන්ථක හාමුදුරුවෝ හැකියා දක්ෂතාවලින් යුක්ත අයෙකු බව හඳුනා ගැනීම, ඉවසිලිමත් බව, බුදුන් වහන්සේගේ උපායශීලී බව, එක් පැත්තක් පමණක් බලා විසඳුම් නොසෙවීම, හැම පැත්තක් ගැනම බැලීම, ළමුන්ට දියුණු කළ හැකි සිතක් ඇති බව දැකීම, නිසි මග පෙන්වීමෙන් හය දියුණු කළ හැකි බව. (01 පාඩම - 6 පිටුව)

3.

i. උපතිස්ස - සැරියුත් හිමි, කෝලිත - මුගලන් හිමි

ii. අස්සජි හිමියන් විසින් උපතිස්ස තරුණයාට - වේදනා පරිග්‍රහ සූත්‍රය

iii. 06 පාඩම - 45 පිටුව

4.

i. සෝ ඉමං ලෝකං පභාසේති
   අබ්භා මුත්තෝව චන්දිමං

ii. තමාට හානියක් සිදුවීම, අනුන්ට හානියක් සිදුවීම, තමන්ට හා අනුන්ට හා දෙපක්ෂයටම හානියක් සිදුවීම.

iii. 15 පාඩම - 104 පිටුව

5.

i. අජාසත්ත රජු- අනුග්‍රහය
   මහා කාශ්‍යප මහ රහතන්වහන්සේ - ප්‍රධානත්වය

ii. විසිර පැවති ධර්මය එක්රැස් කිරීම.
   ධර්ම විනය කොටස් කිරීම හා කටපාඩමින් රැකගැනීම.
   ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාවට පැවරීම.

ධර්මය ගුරුතැන්හි තබා ගැනීම.

බුද්ධානුබුද්ධක ශික්ෂා පද වෙනස් නොකිරීම.

iii. අදාළ පාඩම - පිටු අංක 125 දී ඇති කරුණු වලින් නිදසුන් ලියා තිබිය යුතුයි.

6.

i. දළදා වරුණ, දළදා පූජාවලිය, දාඨාවංශය, දළදා සිරිත

ii. දෛනික පූජා, සප්ථාහික පූජා, වාර්ෂික පුදපූජා

iii. අදාළ පාඩම බලන්න.

7.

i. ගේ දොර කටයුතු සංවිධානාත්මකව කිරීම.

ස්වාමියාගේ ඥාතිමිත්‍ර සේවකාදීන්ට මැනවින් සැළකීම.

වෙනත් පුරුෂයන් නොපැතීම.

උපයා ගත් ධනය ආරක්ෂා කිරීම.

දක්ෂව අනලස්ව සියළු කටයුතු කිරීම.

ii. සතර සංග්‍රහ වස්තුවෙන් සැළකීම

පමා වූ මිතුරා රැක ගැනීම.

පමා වූ මිතුරාගේ ධනය රැකීම.

බියක් පැමිණි විට මිතුරාව

ආපදාවන්හි හැර නොයාම.

මිතුරාගේ දරු මුණුපුරන්ව ආරක්ෂා කිරීම. මේ කරුණු යටතේ පිළිතුරු ලියා ඇත්නම් සම්පූර්ණ ලකුණු දිය හැක.

iii. ඇඳුම්පැළඳුම්, කෑම බීම, ගමන බිමන ආදියේදී සේඛියා ධර්ම වලට අනුව ක්‍රියා කිරීමත් ශිෂ්ට සම්පන්න බව ප්‍රදර්ශනය වන බව උදාහරණ මගින් ලියා තිබීම.

8.

i. 17 පාඩම බලන්න.

ii. 13 පාඩම බලන්න

iii. 20 පාඩම බලන්න.

iv. 05 පාඩම බලන්න.